# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/59 - 2023 පෙබරවාරි මස 22 වැනි බදාදා - 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියමය**

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය රොෂාන් රණසිංහ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත හා සංශෝධන අනුව 32(ආ) සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි පරිපාලන හා වෙනත් යම් අවැසි කටයුතු සහ අදාළ නිලවරණයන් කැඳවීමට හා පැවැත්වීමටත් එතෙක් යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 2023 පෙබරවාරි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන අමල් එදිරිසූරිය මහතාව නිසි බලධරයා ලෙස මෙයින් පත් කරමි.

01. ශ්‍රී ලංකා හෑන්ඩ්බෝල් සම්මේලනය
02. ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සම්මේලනය
03. ශ්‍රී ලංකා එල්ලේ සම්මේලනය

**රොෂාන් රණසිංහ (පා.ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2023 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0264

1A - G 38934 — 07 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*